# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1875/38 - 2014 අගෝස්තු මස 15 වැනි සිකුරාදා - 2014.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංක. 50

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් සියළුම ගොඩනැගිලි කාර්මාන්තය සඳහා යොදා ගන්නා තීන්ත, වාර්නිෂ් හා ද්‍රාවක නිෂ්පාදකයින් හා වෙළෙඳුන් වෙත, එකී තීන්ත, වාර්නිෂ් හා ද්‍රාවක බෝතල්, ඇසුරුම් හෝ බහාලුම්වල පහත තොරතුරු පැහැදිලිව මුද්‍රණය කළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(අ) කාණ්ඩ අංකය
(ආ) නිෂ්පාදිත දිනය
(ඇ) භාවිතයට ඉතා සුදුසු අවසන් දිනය (Best before Date)
(ඈ) පරිමාව
(ඉ) උපරිම සිල්ලර මිල

ඉහත තොරතුරු වලට වැඩිමනත් වශයෙන්, ගොඩනැගිලි කර්මාන්තය සඳහා යොදා ගන්නා සියළුම තීන්ත නිෂ්පාදකයින් හා වෙළෙඳුන් විසින් තීන්ත ඇසුරුමේ හෝ බහාලුමේ තීන්තවල අඩංගු සම්පූර්ණ ඊයම් ප්‍රමාණය මිලි ග්‍රෑම්/කිලෝ ග්‍රෑම් වලින් පැහැදිලිව මුද්‍රණය කළ යුතු බවටද මෙයින් විධාන කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් පිළිවෙලින් 2003 අගෝස්තු මස 25 වැනි දින අංක 1303/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* හා 2005 අගෝස්තු මස 26 වැනි දින අංක 1407/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත විධාන අංක 2 හා 4 හි සඳහන් ''ගොඩනැගිලි කර්මාන්තය සඳහා යොදාගන්නා තීන්ත, වාර්නිෂ් හා ද්‍රාවක'' යන්න පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් ඉවත් කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2014 සැප්තැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2014 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

08 - 1029/1


1A - PG 2142 — 200 (2014/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

විධාන අංක. 51

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වන වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වන වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් සියළු නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන්, සැපයුම්කරුවන් හෝ වෙළෙඳුන් විසින් කල් ඉකුත් වූ හෝ විකිණීමට නුසුදුසු/ආයෝග්‍ය ලෙස හඳුනාගත් සහ ඒ අනුව විනාශ කිරීමේ කාර්ය සඳහා / ප්‍රති අපනයනය සඳහා හෝ තබාගනු ලබන, ගබඩා කරනු ලබන, එක්රැස් කරනු ලබන සියළු භාණ්ඩවල එම භාණ්ඩ වර්ගය, සන්නම් නාමය, බර/පරිමාව සහ ඒකක ගණන සඳහන් ලේඛනයක් පවත්වාගෙන යන්නේ නම් මිස එවන් භාණ්ඩ යම් ගුදමක, ගබඩාවක හෝ වෙනත් යම් ස්ථානයක තබාගැනීම, ගබඩා කිරීම හෝ එක්රැස් කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2014 සැප්තැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2014 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

08 - 1029/2

විධාන අංක. 52

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වන වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් සියළු නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන්, සැපයුම්කරුවන් හා වෙළෙඳුන් විසින් තම ව්‍යාපාර ක්‍රියාවලිය තුලදී විකිණීමට නුසුදුසු / ආයෝග්‍ය බවට හෝ කල් ඉකුත් වූ බවට / මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට හඳුනාගත් භාණ්ඩ කිසිදු ආකාරයකින් හෝ විකිණීමට ඉදිරිපත් කරනු ලබන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන අනෙකුත් භාණ්ඩ සමග එක්ව හෝ එකට යාව හෝ තැබීම, ගබඩා කිරීම හෝ එක්රැස් කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2014 සැප්තැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2014 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

08 - 1029/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.